**ශීර්ෂය 333 - කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 333 - කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොගෙන වැය විෂයන් 04ක් සඳහා එකතුව රු.1,349,142 ක් සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් හා මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | විදේශ ගමන් වෙනුවෙන් ඇස්තමේන්තු නොකල නමුත් විදේශ පුහුණු වීම් සඳහා නිලධාරියෙක් යොමු කිරීමට සිදු වීම, කාර්යාල ඉඩ පහසුකම් පුළුල් කිරීම, අවශ්‍ය කාර්යාල උපකරණ මිල දී ගැනීමට අවශ්‍ය වියදම් දැරීම, මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කලමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරිම සඳහා අත්‍යාවශ්‍ය වූ උපකරණ මිල දී ගැනීම සඳහා මුදල් රෙගුලාසි අනුව අමතර ප්‍රතිපාදන සලසා ගැනීමට සිදු විම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිවැරදිව හා තාත්ත්විකව කළ යුතු වීම. |
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (අ) ඡේද යටතේ දක්වා ඇති වැය විෂයයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන හැර අනෙකුත් සියළුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් හෙවත් රු.869,967 ක් අවම වශයෙන් කපා හැරීම සිදු කළ යුතු වුවත්, කපා හැර තිබුණේ රු.74,479 ක් එනම් සියයට 0.5 ක ප්‍රමාණයක් පමණක් බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛයේ 07 (1) (ආ) අනුව අත්‍යාවශ්‍ය කටයුතු පවත්වා ගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන සඳහා පමණක් ඇස්තමේන්තු සකස් කරන ලදී. ඒ අනුව, අයවැය චක්‍රලේඛ 01/2023 හි උපදෙස් අනුව කපා හැරීමට අත්‍යාවශ්‍ය නොවන වියදම් නොතිබූ බැවින් හැකි උපරිම අයුරින් ප්‍රතිපාදන කපා හැරීමට කටයුතු කර ඇත | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

රජයේ සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම තුළින් රජයේ වත්කම් කළමනාකරණය, වත්කම් පිළිබඳ පිරිවැය කළමනාකරණය හා අධීක්ෂණය කිරීම අරමුණු කොටගෙන 2017 වර්ෂයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය යෝජනාවක් අනුව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවා තිබුණි. ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, නැව්, ගුවන් යානා, යන්ත්‍රෝපකරණ ආදිය ද ඇතුළත් දේශීයව හා විදේශීයව රජය සතු සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය ඉටු කළ යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවා 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 06 ක් ඉක්මගොස් තිබුණ ද, ඉහත දක්වන ලද සියලු වත්කම් ඇතුළත් කොට මධ්‍යගතව ලේඛනගත කිරීමක් සිදු කිරීමට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට නොහැකි වී තිබුණි. කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් වත්කම් පිළිබඳව මධ්‍යගත ලේඛනගත කිරීම සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්වය පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ මධ්‍යගත දත්ත පද්ධතියට අදාළව තොරතුරු ඇතුළත් කළ යුතු රාජ්‍ය ආයතන 1,773 ක් (රජයේ ආයතන හා රාජ්‍ය ව්‍යාපාර, පළාත් සභා සහ පළාත් පාලන ආයතන) 2021 දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන තිබුණ ද, කාර්යාලය විසින් එම ආයතනවලට අදාළව ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු දත්ත පද්ධතිය තුළ යාවත්කාලීන කර නොතිබුණි. | මෙම මධ්‍යගත දත්ත පද්ධතිය මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතියක් මඟින් ස්ථාපිත කිරීමට 2017 වර්ෂයේ සිට උත්සාහ කළ අතර, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 මඟින් 2023.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කලමනාකරණ පද්ධතිය (NFAMS) ස්ථාපිත කර 2023.09.01 දින සිට එහි පළමු මොඩියුලය ලෙස වාහන පිළිබඳ තොරතුරු කැඳවා ඇත. | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවීමේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | තවද, 2023 සැප්තැම්බර් 01 දින සිට මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) ස්ථාපිත කෙරුණ ද, වාහන මොඩියුලය යටතේ එදින සිට පමණක් ආවරණය වන ලෙස වාහන පිළිබඳ තොරතුරු කැඳවා තිබුණි. එසේ වුවද රජයට අයත් නැව්, ගුවන් යානා, දුම්රිය, මගී ප්‍රවාහන බස්රථ යනාදී වත්කම් පිළිබඳ තොරතුරු, දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට මේ වන විටත් නොහැකි වී තිබුණි. | එම | කඩිනමින් තොරතුරු ගෙන්වාගෙන මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විගණනයට ලබා දුන් තොරතුරු අනුව, 2023 අගෝස්තු 24 දින වන විටත් රාජ්‍ය ආයතන 699 කට අදාළව වාහන, ගොඩනැගිලි හා ඉඩම් පිළිබඳව තොරතුරු ලබාගැනීමට නොහැකි වී තිබුණි. | එම | එම |
| (ඈ) | කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 මඟින් පිරියත, යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සඳහා තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විට කිසිඳු ආයතනයකින් තොරතුරු ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | එම | එම |
| (ඉ) | රාජ්‍ය ආයතන විසින් වාහන හැර අනෙකුත් වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳව තොරතුරු කාර්යාලය වෙත වාර්තා කිරීම සඳහා වන ක්‍රමවේදයක් 2024 සැප්තැම්බර් 04දින දක්වා ස්ථාපිත කර නොතිබුණි. | NFAMS තථ්‍යකාලීන දත්ත වාර්තා කරනු ලබන මාර්ගගත තොරතුරු පද්ධතියක් වන අතර පළමු මොඩියුලය ලෙස වාහන මොඩියුලය ක්‍රියාත්මක කර ඇති අතර අනෙකුත් මූල්‍ය නොවන වත්කම් මොඩියුලයන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් මිලදී ගැනීම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු ඇතුළත් කර මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | 2023 අගෝස්තු 09 දින රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නියෝග ප්‍රකාරව කාර්යාලය විසින් NFAMS ට දත්ත ඇතුළත් කිරීම සඳහා එක් එක් වත්කම් සඳහා මාර්ගගත (Online) දත්ත පද්ධතිය ක්‍රියාත්මක කර සම්පූර්ණ කිරීමට 2023 දෙසැම්බර් 31 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාල පරාසය තුළ කාල රාමුවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, වාහන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කර 2023 දෙසැම්බර් 31 දින වන විට දත්ත පද්ධතිය සම්පූර්ණ කරනු ලබන බව දක්වා තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය ආයතන 110 ක වාහන පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | NFAMS පද්ධතියෙහි වාහන මොඩියුලය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - රාජ්‍ය ආයතනවල (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර, පළාත් සභා හා පළාත් පාලන ආයතන) තොරතුරු ඇතුලත් කිරීමේ ඒකක (data entry points) වලින් 95% ක් මේ වන විට තොරතුරු වාර්තා කර ඇත. | තොරතුරු ලබා නොදුන් රාජ්‍ය ආයතන වෙතින් කඩිනමින් තොරතුරු ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කළ යුතු වීම. |
| (උ) | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තක්සේරු වටිනාකම් ඇතුළත් කර මධ්‍යගත ලේඛනය සකසා නොමැති වීම හේතුවෙන් | මූල්‍ය නොවන වත්කම් කලමනාකරණ පද්ධතියෙහි (NFAMS) පළමු මොඩියුලය ලෙස වාහන මොඩියුලය | රජයේ ගිණුම තුළ දැක්වෙන මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම |

| | | |
|---|---|---|
| රජයේ ගිණුමේ දැක්වෙන මූල්‍ය නොවන වත්කම් ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි. | ක්‍රියාත්මක කර ඇති අතර අනෙකුත් මූල්‍ය නොවන වත්කම් මොඩියුලයන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව නිරූපණය කළ හැකි වන ලෙස පද්ධතිය සැකසීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම ආදී කටයුතු, සියලු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණි. එසේවුවද, කාර්යාලය විසින් ඉහත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේ අවස්ථා 02 ක දී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව එකතුව රු.831,900 ක භාණ්ඩ මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි. | රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන කාර්යයන්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය අනුව සහ ආනුෂංගික චක්‍රලේඛ අනුව ඉටු කරනු ලබන අතර, 2024 වර්ෂයේ මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය ඔස්සේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කර ප්‍රසම්පාදන කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට කාර්යාලයේ පුරප්පාඩු 09 ක් පැවති අතර, එම පුරප්පාඩු අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් පැවතුණි. එය අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 50 ක් විය. | මෙම කාර්යාලයේ කටයුතු පවත්වා ගැනීමට මෙම පුරප්පාඩු පිරවීම අවශ්‍ය වේ. මෙම පුරප්පාඩු පුරවන ලෙස දන්වා ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |